(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(6).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2011 ජනවාරි මස 21 වැනි සිකුරාදා**

## 2011 පෙබරවාරි මස 08 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 24 දිනැති, අංක 1685/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2011 පෙබරවාරි මස 22 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0315/'10

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'10

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2005 සිට 2010 අගෝස්තු දක්වා කාල සීමාවේදී කොරියානු රජය මගින් ශ්‍රී ලංකාවට ලබා දුන් විදේශ රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා අවස්ථාවක් ලබා ගැනීමට පුද්ගලයකු විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම රැකියා සඳහා පිටත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොරියානු රැකියාවක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචි වී සිටින සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ කොරියානු රැකියා අපේක්ෂකයෙකු ගේ ලියා පදිංචිය වලංගුවන කාල සීමාව කවරේද;

(ii) ඉහත ලියාපදිංචිය අවලංගු වූ රැකියා අපේක්ෂකයෙකු කොරියාවේ රැකියාවක් ලබා ගැනීම සඳහා නැවත අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මේ සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචිවී සිටින රැකියා අපේක්ෂකයින්හට ප්‍රමුඛත්වය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/’10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2006 වර්ෂයේ පැවැත්වූ බවත්;

(ii) එම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 16,000 ක් අතරින්, 1000 ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත්:

(iii) එම පිරිසෙන් 550 දෙනෙකුට 2007 වර්ෂයේ අප්‍රියෙල් 01 වන දින සිට පත්වීම් ප්‍රදානය කළ බවත්;

(iv) එම පත්වීම්ලාභීන් අතර මෙම විභාගයට අදාළව 2006 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයේ සඳහන් දිනට උපාධි සහතිකය නොමැති අය සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදු නිලධාරීන් ලෙස ඉහත පත්වීම් ලැබූ එක් එක් අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006.12.08 දින පෙරවරු 9.30ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ජා-ඇල” නැගෙනහිර තුඩැල්ල, අංක 76/සී හි පදිංචි, ඩබ්ලිව්. ඒ. එස්. එම්. සෝවිස් මහත්මිය එම විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0780/’10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට විදේශ රටවල සේවයේ නියුතු විවාහක ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මෙරට සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එම දරු දැරියන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති වැඩ සටහන් කවරේද?

(iii) එවැනි වැඩසටහන් සඳහා රජය වර්ෂයකට වැය කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0317/'10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබාගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද; සහ

(vii) පසුගිය වර්ෂ 06 තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහල යැමට හේතුවී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබාගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද; සහ

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0575/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වනවිට එක් එක් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ගේ සංඛ්‍යාව පාසල් වර්ගීකරණය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) පසුගිය අයවැය යටතේ ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 2008/50 හි 2 කොටසේ VI වැනි වගන්තියට යටත් ස්වේච්ඡා ගුරුවරුන් මේ වන තෙක් ස්ථිර සේවයේ පිහිටුවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0781/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට නැගෙනහිර පළාත තුළ පදිංචි, ත්‍රිවිධ හමුදා, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බළකාය සහ සිවිල් ආරක්ෂක සේවයේ යෙදී සිටියදී තම ස්වාමි පුරුෂයන්, අහිමිවූ කාන්තාවන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැන්දඹු කාන්තාවන් වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

(iii) ඔවුන්ගේ දරුවන් සම්බන්ධයෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන් වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද සහ ඔවුන් කවර ප්‍රදේශවලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි ණය ලබාගත් සංඛ්‍යාව;

(ii) එම ණය ලබා දී ඇති පොලී අනුපාතිකය;

(iii) ණය ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත;

(iv) මේ වන විට අය කර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ණය ලබාගත් සමෘද්ධිලාභීන්ගෙන් ණය අයකර ගැනීමේදී නිලධාරීන් අත්තනෝමතික ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0782/’10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ පදිංචි උපතින්ම අබාධිත සහ විවිධ අනතුරු හා රෝගාබාධවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආබාධිත පුද්ගලයන් සඳහා රජය මගින් සලසනු ලබන සහන සේවාවන් කවරේද;

(iii) ඒ සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2011 පෙබරවාරි මස 22 වැනි අඟහරුවාදා)

0664/’10

ගරු අනුර දිසානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ආරම්භයේදී, වී අලෙවි මණ්ඩලය සතුව තිබූ,

(i) ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගබඩාව පිහිටි ස්ථාන කවරේද;

(iii) එම ගබඩාවල ධාරිතාව වෙන වෙනම කොපමණද;

(iv) එක් එක් ගබඩාවේ සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද වන විට රජය සතු,

(i) වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) වී ගබඩා පිහිටි ස්ථාන කවරේද;

(iii) එක් එක් ගබඩාවේ ධාරිතාව හා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වී මිළදී ගැනීම සඳහා වෙන් කළ වාහන වර්ග සහ සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 5 තුළ,

(i) යල හා මහ කන්නවලදී එක් එක් ගබඩාව මිලදී ගත් වී ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වී ගැණුම් මිල කොපමණද;

(iii) වී විකුණුම් මිල කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ මිලදීගත් වී තොගවලින් විනාශ වූ වී ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0665/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 තුළ, යල සහ මහ කන්නවලදී, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කෘෂිකාර්මික භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් අපනයන භෝග වගා කළ හෙක්ටයාර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අපනයන භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ, එක් එක් වර්ෂයේ,

(i) වගාකරන ලද එක් එක් කෘෂිකාර්මික භෝගවලින් ලද අස්වැන්න කන්න අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් අපනයන භෝගයේ වාර්ෂික අස්වැන්න සහ එම භෝගයන්හි අපනයන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම භෝගවල සමස්ත අපනයන වටිනාකම කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0666/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 1977 වන විට තිබූ රජයේ ගොවිපලවල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ගොවිපලේ,

(i) නම, ගොවිපල පිහිටුවීමේ අරමුණ සහ කරන ලද කාර්යභාරය කවරේද;

(ii) විශාලත්වය හා සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ලාභ ලැබූ වර්ෂ, ලැබූ ලාභය, ලාභ ලැබූ අංශ හා ලාභ ලැබූ වර්ෂ කීපයක නිෂ්පාදන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොවිපලවල් අතරින් පෞද්ගලික අංශයට පැවරූ ගොවිපලවල් කවරේද;

(ii) ඒවා පවරන ලද පුද්ගලයින් හා වර්තමාන හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම පැවරීම් කළ දිනයන්, මිල ගණන් හා පැවරුමේ මූලික කොන්දේසි කවරේද;

(iv) දැනට පෞද්ගලික ගොවිපලවලින් ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) දැනට රජය සතු ගොවිපල්වල,

(i) ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

(ii) සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ ලැබූ ලාභ හෝ අලාභ ප්‍රමාණ කවරේද;

(iv) පසුගිය වර්ෂයේ නිපැයූ එක් එක් නිෂ්පාදනයන්හි අගයයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0667/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට කෘෂිකර්මාන්තයට අදාළව මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් සභා තුළ පිහිටුවා ඇති රාජ්‍ය ආයතන (දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි) කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ආයතනය,

(i) පිහිටුවූ දිනයන්, පිහිටුවීමේ අරමුණු සහ ඉටු කරනු ලබන කාර්යය;

(ii) පිහිටුවා ඇති තනතුරු හා ඒ ඒ තනතුරේ අද වන විට සිටින සේවක සංඛ්‍යාව;

(iii) ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය සහ ඒවායේ සංවිධාන ව්‍යුහය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අද වන විට කෘෂිකර්මාන්තයට අදාළව පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය පිහිටු වූ අය සහ ඒවාට ප්‍රතිපාදන ලබා දෙන අය කවුරුන්ද:

(iii) මේ වන විට එම සංවිධාන මගින් වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

(iv) එම එක් එක් ආයතනයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0669/'10

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහා වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාරිමාර්ගය අයත් ආසනය කුමක්ද;

(iii) එම එක් එක් වාරිමාර්ගයේ නම සහ ජල මූලාශ්‍රය කවරේද;

(iv) ජල පෝෂිත ප්‍රමාණය සහ එහි ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් වාරිමාර්ගය,

(i) ඉදිකිරීම් ආරම්භ කළ වර්ෂය;

(ii) අවසන් කළ වර්ෂය;

(iii) ජනතා අයිතියට පැවරූ දිනය;

(iv) නිමකිරීම සඳහා වැය කළ මුදල;

කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 20 තුළ, එම එක් එක් වාරිමාර්ගය වෙනුවෙන්,

(i) ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) මුදල් වෙන් කළ වර්ෂයන් කවරේද;

(iii) ඉටු කරන ලද කාර්යය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ඉහත එක් එක් වාරිමාර්ගයට අදාළව,

(i) අස්වද්දන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ යල සහ මහ කන්නවල වෙන් වෙන් වශයෙන් වගා කළ ඉඩම් ප්‍රමාණය;

(iii) පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මහතාට එරෙහිව ගොනු කොට තිබූ සියලු චෝදනාවලට නිවැරදිකරු බව සනාථ වී තිබුණ ද විශ්වවිද්‍යාල සභාවෙන් ගත් තීරණයකට අනුව එතුමා සේවයෙන් පහ කොට ඇති බවත්;

(ii) ආචාර්ය වික්‍රමසිංහ මහතා විසින් ඉහත තීරණය අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කළ අතර, එම තීරණය අවලංගු කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කර ඇති බවත්;

(iii) තම රැකියාව අහිමි වීමට හේතු වූ ද්වේෂ සහගත චෝදනා ඉදිරිපත් කරමින් එම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මීරානි වීරසූරිය තමන්ට සිදු කළ හානි පිළිබඳව ආචාර්ය වික්‍රමසිංහ මහතා මාතර දිස්ත්‍රික් උසාවියේ පෞද්ගලික පැමිණිල්ලක් කර ඇති බවත්; සහ

(iv) මෙම පෞද්ගලික නඩුවේදී පවා මහාචාර්ය වීරසූරිය සඳහා සේවය ලබාදෙන නීතිඥවරුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය ගෙවීම් සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ බලධාරීන් ගන්නා ඉහත ක්‍රියාමාර්ග සාධාරණීකරණය කළ හැකිද යන්න; සහ

(ii) ඉහත කාරණය පිළිබඳව විමසා බැලීමට විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට උපදෙස් දුන්නේද යන්නත්; අනාගතයේදී මෙවන් සිදුවීම් වැළැක්වීමට යෝග්‍ය පියවර ගන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0777/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා ලැබුණු විදේශ පර්යේෂණ සඳහා වූ ප්‍රදානයන්හි වටිනාකම් සහ ඒවා ලැබුණු මූලාශ්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වෛද්‍ය විද්‍යා පීඨය විසින් එම අරමුදල් උපයෝජයනය කළ ආකාරය කවරේද;

(iii) මෙම ආධාර ලැබීම් සම්බන්ධව සහ මෙම ආධාර භාවිතා කරමින් කරන ලද පර්යේෂණවල සොයාගැනීම් පිළිබඳව වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ සභාව, සනාථන සභාව සහ අධ්‍යයන අධිකාරිය දැනුවත් කරන ලද්දේද;

(iv) නොඑසේ නම්, අදාළ අධිකාරීන් දැනුවත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 1978 අංක 160 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය අනුව සහ රජයේ අනෙකුත් මූල්‍ය රෙගුලාසිවලට අනුව මෙම අරමුදල් විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ඇතුළත් කරන ලද්දේද;

(ii) නොඑසේ නම්, ගිණුම්ගත නොකිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 පෙබරවාරි මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0324/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සිගරට් පරිභෝජනය තුරන් කර දැමීම 'මතට තිත' වැඩ සටහනට ඇතුළත් කර තිබේද;

(ii) පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකාවේ සිගරට් සහ බීඩි පරිභෝජනය වාර්ෂික පදනමින් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 6 තුළ දේශීය වශයෙන් නිපදවන ලද සිගරට් සහ බීඩි ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පසුගිය වර්ෂ 6 තුළ රටට ආනයනය කරන ලද සිගරට් ප්‍රමාණය කොපමණද;

(v) දේශීය වශයෙන් නිෂ්පාදිත හා ආනයනික සිගරට් මත බදු පැනවීමෙන් පසුගිය වර්ෂ 6 තුළ උපයා ගන්නා ලද ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ රලිතුලායි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0559/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0570/'10

ගරු කරු ජයසූරිය මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රද්දොළුගම නිවාස සංකීර්ණයේ ඉතිරිව ඇති බිම් කැබලි විකිණීමට නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ සැළසුමක් එහි නිවාසලාභීන් අතිගරු ජනාධිපතිතුමා වෙත කළ පැමිණිල්ලක් අනුව අත්හිටවූ බවත්;

(ii) ඒ සම්බන්ධව ජනාධිපති විමර්ශණ අංශය කළ පරීක්ෂණයේ නිර්දේශය ජනාධිපති ලේකම් විසින් එවකට නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙතද, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු අංක SP/4/2/4/2/1 හා 2006/02/28 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත්;

(iii) එම ලිපියේ (කෙටියෙන්) "ඉතිරිව ඇති කුඩා බිම් කැබලි වසර 23 පමණ කාලයක් එහි නිවැසියන් භුක්ති විද ඇති හෙයින් ඔවුනට විකිණීමෙන් පවරාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර තිබිණ. ජනාධිපති විමර්ශන අංශයේ නිර්දේශය අනුව රද්දොළුගම නිවාස සංකීර්ණය වටා යාමට ඇති මාර්ගය 1820 බිම් කොටසෙන් වෙන් කිරීම සහ 1819 බිම් කැබැල්ල යාබද නිවැසියන් වෙත විකිණීමෙන් පවරාදීම සුදුසු බවත් දන්වමි" යන්න සඳහන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අතිගරු ජනාධිපතිතුමාගේ ඉහත නියෝගය නොපමාව ඉටුකර දීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0682/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිලිනොච්චියද ඇතුළු උතුරු පළාත තුළ, ආරක්ෂක හමුදා විසින් දැනට ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කරන පෞද්ගලික නිවාස හා ආයතන සංඛ්‍යාව කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ස්ථානයන් ඒවායේ මුල් අයිතිකරුවන්හට ආපසු භාර දෙන්නේ කවදාදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0706/'10

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල සමෘද්ධිලාභීන්ට වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් වර්ෂය තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිට එහෙත්, පසුව ඉවත් කරන ලද සංඛ්‍යාව, එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද පදනම කවරේද;

(iii) එම කාල සීමාවේදී අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටී නම්, ඔවුන්ට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0707/'10

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු නැගෙනහිර පුනරුත්ථාපන සංවිධානය (NERDO—North East Rehabilitation and Development Organisation) නම් සංවිධානයක් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර තිබේද;

(ii) එසේ නම්, එය ලියාපදිංචි කරන ලද දිනය කවරේද;

(iii) එම සංවිධානය පිහිටුවීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම සංවිධානයේ කාර්යාලය පිහිටා ඇති ස්ථානය, එහි ප්‍රධානීන්ගේ නම්, කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0848/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පුත්තලම් දිස්ත්‍රික්කයේ ඇති එකම කෘෂි ආර්ථික මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොරොච්චෝල ප්‍රදේශයේ බවත්;

(ii) කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සාරවත් බවක් නොමැති, දීර්ඝ වැලිබිම් තීරුවකින් වැසී ඇති බවත්;

(iii) එම ප්‍රදේශයේ ගොවීන් විසින් යූරියා ඇතුළු රසායනික පොහොර යොදා සාරවත්කර ගනු ලබන එම අසාරවත් වැලිබිම් තීරුව තුළ ලංකාවට අවශ්‍ය රතුළූණු, එළවළු, පළතුරු අවශ්‍යතාවයෙන් 1/3ක් පමණ අතිසාර්ථකව නිෂ්පාදනය කරන බවත්;

(iv) එසේ වුවද වී වගාවේදී රජය මඟින් යූරියා ඇතුළු අනෙකුත් පොහොර සඳහා ලබා දෙන සහනාධාරය කල්පිටිය ගොඩ ගොවිතැන් කරන ගොවීන්ට නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වී වගාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය අසාරවත් පොළව සමඟ ගැටෙන්නාවූ අති දුෂ්කර කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොඩ ගොවිතැන් කරන ගොවියන්ටත් ලබාදීම සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම පොහොර සහනාධාරය කල්පිටියේ ගොවීන්ටත් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0877/’10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වීරවිල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදිකිරීම සඳහා 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල වැයකරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙනයන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම ව්‍යාපෘතිය අතහැර දැමීම නිසා ශ්‍රී ලංකා රජයට සිදුව ඇති අලාභය කොපමණද;

(v) එම අලාභය සිදුවීමට වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් කවුරුන්ද;

(vi) ඔවුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0886’/10

ගරු විජිත හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, පැපිලියවල, පල්ලේගම පිහිටි බප/ගම්/ආනන්ද විද්‍යාලයේ වර්ෂ 2011 සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත්කර ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ පැවැත් වූ දිනයන් කවරේද;

(ii) සුදුසුකම් ලද හා නොලද අයදුම්කරුවන්ගේ නම්, ලිපිනයන්, අදාළ ගනය හා ලකුණු වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ අදාළ චක්‍රලේඛයට අනුව අයදුම්පත්‍රයේ සඳහන් ලියාපදිංචි ඡන්ද හිමි නාම ලේඛනවල තොරතුරු සනාථ කර ගැනීම පිණිස ග්‍රාම නිලධාරී ලිපියක් අවශ්‍ය වන්නේද යන්නත්;

(ii) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ පමණින් චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් සනාථ කිරීමේ ලිපි ලේඛන පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැකියාව තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ග්‍රාම නිලධාරී ලිපියක් නොතිබූ ඇතැම් අයදුම්කරුවන් නැවත සම්මුඛ පරීක්ෂණයට වෙනත් දිනයක කැඳවා තිබූ බවත්;

(ii) ඒ සඳහා විධිමත් දැනුම් දීමක් කර නොතිබූ බැවින් එක් අයදුම්කරුවෙකු අසාධාරණයට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මේ අනුව අසාධාරණයට ලක් වූ එම අයදුම්කරුට සාධාරණය ඉටුකර දීමටත්;

(ii) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්;

එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0888/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව, පේරකනත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගහේයාය ඉඩමේ බිම් කැබලි 42 ක් 2002 වර්ෂයේ දී ඉඩම් කච්චේරියක් පවත්වා ඉඩම් නොමැති ගොවීන් අතර බෙදා දී ඇති බවත්;

(ii) පසු කාලයකදී එම ඉඩම්ලාභීන් පලවා හැර වෙනත් පුද්ගලයින් විසින් එම ඉඩම් කොටස් බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බවත්;

(iii) එසේ පලවා හරින ලද ඉඩම්ලාභීන් විසින් ඒ පිළිබඳව පැමිණිලි කළද මේ දක්වා ඒ පිළිබඳ කිසිදු විභාගයක් පවත්වා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ 2002 දී ඉඩම් බෙදාදීමට අනුව එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) තම ඉඩම්වලින් පලවා හරින ලද එම ඉඩම්ලාභීන් විසින් ඉදිරිපත් කළ පැමිණිලි විභාග කර ඔවුන්ගේ ඉඩම් අයිතිය තහවුරු කර නැවත පදිංචි කරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0584/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ හතරක කාලය තුළ ද්වීපාර්ශ්වික පදනම මත මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමට ලබාදෙන කාලය සහ ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාල සීමාව සම්බන්ධයෙන් කරන ලද අලුත්කිරීම් කවරේද;

(ii) එවැනි පහසුකම් ලබාදෙන ලද දිනය කවරේද;

(iii) එවැනි පහසුකම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) ඉහත කී ණය මුදල් සම්බන්ධයෙන් කිසියම් ආරම්භක ගාස්තුවක්, පොරොන්දු ගාස්තුවක්, කළමනාකරන හෝ පරිපාලන ගාස්තුවක්, රක්ෂණ වාරිකයක්, සහ හෝ වෙනත් කිසියම් නම්වලින් හැඳින්වෙන පිරිවැයක් දැරීමට සිදුවී තිබේද;

(v) එක්වර ගෙවිය යුතු ගෙවීම් හෝ වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් තිබේද;

(vi) පිරිවැය සාධකයක් ලෙස රට කෙරෙහි බලපෑමක් ඇති කරන ඉහත කී ගෙවීම් සඳහා වර්ෂයකට ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්ෂ 2006 සිට මේ දක්වා විදේශයන්හිදී මිය ගිය විදේශගත ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මරණවලට හේතු කවරේද;

(iii) එසේ මිය ගිය අයගෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් මෘත දේහ සංඛ්‍යාව කොපමණද;

(iv) මෘත දේහ ගෙන්වා ගැනීමට නොහැකි වූයේ නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මිය ගිය අය වෙනුවෙන් මෙතෙක් වන්දි ලබා දී ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) මිය ගිය අය වෙනුවෙන් වන්දි ලබා නොදුන් අවස්ථා වේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0585/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජය, 1970 - 1980, 1980 - 1990, 1990 - 2000 යන කාලසීමාවන්හිදී සම්පූර්ණයෙන් ලබා ගත් ණය මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය මුදල් බහු පාර්ශ්වීය ණය මුදල්ද; නොඑසේ නම් ද්විපාර්ශ්වීය ණය මුදල්ද;

(iii) ඉහත කී ණය මුදල් සඳහා අදාළවන පොලී අනුපාතිකයන් සහ වාර්ෂිකව ගෙවන ලද පොලී මුදල කොපමණද;

(iv) එකී ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිමකර තිබේද;

(v) ඉහත කී ණය මුදල් සඳහා ගෙවන ලද සම්පූර්ණ පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය වාර්ෂික පදනමින් කොපමණද;

(vi) දැනට ලබා ගෙන ඇති ණය සඳහා 2015 සිට 2020 දක්වා (වසර පහක) කාලසීමාව සඳහා ගෙවිය යුතු සමස්ත පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0833/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කටුනායක ගුවන් තොටුපලේ රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ගුවන් තොටුපලේ රාජකාරියේ යෙදී සිටින එම සේවකයින් සපුරාලිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන් තොටුපලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා එම දෙපාර්තමේන්තුවට අයත් නොවන බාහිර පුද්ගලයින් යොදවා තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුද්ගලයන්ගේ සුදුසුකම් කවරේද;

(iv) එවැනි පිරිසක් සේවයේ යෙදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 පෙබරවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0376/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0678/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිවන ඉඩම රජය විසින් බදු හෝ වෙනත් ක්‍රමයකට බාහිර පාර්ශ්වයක් වෙත පවරනු ලැබුවේද;

(ii) එසේ පවරා දෙනු ලැබුවේ කවරෙකුටද;

(iii) එම ඉඩම පවරා දුන් මුදල, පැවරුම සිදුකළ වර්ෂය හා ඉඩමේ ප්‍රමාණය කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිය ගොඩනැඟීමෙන් පසු එහි අයිතිය පැවරෙන පාර්ශ්වය කවරෙක්ද;

(v) පවරනු ලබන කාල සීමාව හා මුදල කොපමණද;

(vi) එමගින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල වැය කරනු ලබන්නේ රජය හෝ රජයේ ආයතනයක් විසින්ද; නැතහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය හෝ වෙනත් ආයතනයක් විසින්ද;

(iii) එසේ නම්, එක් එක් පාර්ශ්ව විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගනය සහ ඒහි ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදෙස් ලබා දෙන්නේ කවරුන්ද;

(ii) ක්‍රීඩාපිටිය, ක්‍රීඩා මණ්ඩපය, දිවා රාත්‍රී විදුලි බුබුළු හා වාර්ෂික නඩත්තුව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0705/'10

ගරු (වෛද්‍යා) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිතව මෙරට ක්‍රියාත්මක වන සංවිධාන හෝ ආයතන කවරේද;

(ii) එම එක් එක් සංවිධාන හා ආයතන වෙත පැවරී ඇති කාර්යභාරයන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් ක්‍රියාත්මක කරන වැඩ සටහන් සඳහා රජයේ අනුමතිය ලැබී තිබේද;

(iv) එම සංවිධාන හා ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අධීක්ෂණය සඳහා රජයට ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2005 සිට මේ දක්වා එම එක් එක් සංවිධාන හා ආයතනවලට ලැබී ඇති ආධාර මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0890/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැටවල් ඉදිකිරීමේ දී එය නියමිත ප්‍රමිතියකට අනුව සිදුවන්නේද;

(ii) බදුල්ල දිස්ත්‍රික්කයේ රිදිමාලියද්ද, මහියංගනය, කන්දකැටිය, මීගහකිවුල, ඌව පරණගම හා හල්දුම්මුල්ල යන ප්‍රදේශවල ඉදිකිරීමට යෝජිත විදුලි වැටවල් ඉදිකිරීම ආරම්භ කරන සහ අවසන් කරන දිනයන් කවරේද;

(iii) එම විදුලි වැටවල් ඉදිකිරීම ආරම්භ කිරීමේ ප්‍රමාදයක් සිදුවන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වල් අලි ප්‍රහාර නිසා සිදු වී ඇති අලාභවලට වන්දි ගෙවීමේ ප්‍රමාදයක් සිදුවන බවත්;

(ii) ඊට අදාළව දැනට ලබා දෙන වන්දි මුදල ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම වන්දි ගෙවීම ඉක්මන් කිරීමටත්, වන්දි මුදල් ප්‍රමාණය වැඩි කිරීමටත්, සුදුසු වැඩ පිළිවෙළක් කඩිනමින් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0899/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මත්පැන් බී රෝගී වූ අයෙකුට රජයේ රෝහලකට ඇතුළුවීමේදී මුදල් අයකරනු ලබන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ මධ්‍යසාර අඩංගු අරිෂ්ඨ වර්ග හා කංසා අඩංගු ඖෂධ වර්ග ප්‍රතිකාර සඳහා භාවිතා කරන අතර දිගුකාලීනව එවැනි ප්‍රතිකාර ලබා ගැනීම හේතුවෙන්ද මත්පැන් භාවිතය නිසා ඇති වන සිරෝසිස් නැමැති රෝගී තත්ත්වය ඇතිවන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිසියම් පුද්ගලයෙකුට සිරෝසිස් නැමැති රෝගී තත්ත්වය ඇතිවී ඇත්තේ මත්පැන් බීමෙන්ද, නැතහොත් ඉහත සඳහන් පරිදි ආයුර්වේද ප්‍රතිකාර නිසාද යන්න වෙන් කර හඳුනාගැනීමට පිළිගත් ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0911/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010 සැප්තැම්බර් මාසයේ දකුණු අප්‍රිකාවේ පැවති චැම්පියන්ස් ලීග් 20 - 20 ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද "වයඹ" කණ්ඩායම සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ Musli Power X-tra නම් වූ වෙළඳ නාමයක් සහිත ආයතනයක් විසින්ද;

(ii) එම ආයතනය කවරක්ද;

(iii) එම ආයතනය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) Musli Power X-tra වෙළඳ නාමය යටතේ අලෙවිකරනු ලබන්නේ ලිංගික උත්තේජනය සඳහා භාවිතා කරන නිෂ්පාදනයක් ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ නම්, එම නිෂ්පාදනයට අදාළ ලාංඡනය "වයඹ" ක්‍රිකට් කණ්ඩායමේ තරඟ කටයුතු අතරදී ප්‍රචාරය කිරීම එම ක්‍රීඩකයන්ගේ සහ රටේ ප්‍රතිරූපයට හානිකර බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඉහත තරඟාවලිය සඳහා අනුග්‍රහකයන් තෝරා ගැනීමේදී වගකීමෙන් තොරව ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0917/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නායකත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ආයතනය (Institute for Leadership and Democracy) නමැති සංවිධානයක් ගැන එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත කී ආයතනය පිහිටුවන ලද ආකාරය සහ දිනය කවරේද;

(ii) එම ආයතනයේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ දහයක කාලය තුළ මෙම ආයතනයට,

(i) අරමුදල් සැපයෙන මූලාශ්‍ර කවරේද;

(ii) අරමුදල් ලබාදීමේ අරමුණ කවරේද;

(iii) විදේශ අරමුදල් ලැබී ඇත්නම්, එසේ ලැබී ඇති අරමුදල් ප්‍රමාණය කවරේද;

(iv) විදේශ මූලාශ්‍රයන්ගෙන් ලැබුණු අරමුදල් මහ බැංකුවේ නියමයන්ට අනුකූලව ලැබී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම ආයතනය හෝ එහි කවර හෝ අධ්‍යක්ෂවරයකු සමග කිසියම් දේශපාලන පක්ෂයක සබඳතාවයක් තිබේද;

(ii) මෙම ආයතනයට ලැබුණු විදේශ අරමුදල්වලින් කිසිවක් ඉහත කී දේශපාලන පක්ෂයට ලබා දුන්නේද;

(iii) මෙම ආයතනය සහ ඉහත කී දේශපාලන පක්ෂය අතර කිසියම් සබඳතාවයක් පවතින බව මෙම ආයතනයට විදේශ අරමුදල් සපයන අය දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0594/’10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ අටක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) රාජ්‍ය සේවකයින්ට ලබා දී ඇති ණය මුදලේ ප්‍රාග්ධන ගෙවීම සහ ණය පොලී ගෙවීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) රුපියල් බිලියන විසිපහක වටිනාකම ඉක්මවන ලද වෙනත් පුනරාවර්තන වියදමක් රාජ්‍ය සේවාව වෙනුවෙන් දරනු ලැබුවේ නම්, එම වියදම සහ එහි ප්‍රමාණය කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0713/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට වරාය විවෘත කිරීමේ කරදියවර මංගල්‍යය නම් උත්සවය සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම උත්සවයේ ප්‍රසාංගික කටයුතු භාරව ක්‍රියා කළ පුද්ගලයාගේ හෝ ආයතනයේ නම කවරේද;

(iii) එම කටයුතු ඉටු කරන ලද්දේ ආයතනයක් විසින් නම්, එහි ප්‍රධානියාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(iv) එම ආයතනයට හෝ පුද්ගලයාට ගෙවන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0893/’10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින ප්‍රධාන පාසල්වල සිසු දරුවන්ට අධ්‍යයන නිවාඩු (study leave) නමින් නිවාඩු ලබාදෙන බවත්;

(ii) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට වාර අවසානය වන විට විෂය නිර්දේශයට අයත් පාඩම් මාලා අවසන් කළයුතු වුවත්, අදාළ විෂය භාර ගුරුවරුන් විසින් පාසල් කාල සීමාව තුළදීම උපකාරක පන්ති (Tuition classes) පවත්වන බවත්;

(iii) එම පන්ති පැවැත්වීම සඳහා ඉහත සඳහන් කළ පරිදි ‘අධ්‍යයන නිවාඩු’ ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පරිදි නිවාඩු ලබාදීමට අනුමත කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ‘අධ්‍යයන නිවාඩු’ නිවාඩු ලබාදෙමින් පාසල් කාල සීමා තුළ පන්ති නොපවත්වා එකී කාල සීමාව තුළම මුදලට අමතර පන්ති පවත්වන රජයේ පාසල් ගුරුවරුන් පිළිබඳව සොයා බලා ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0914/’10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමර්සෙට් එන්ටර්ටේන්මන්ට් වෙන්චර්ස් (සිංගප්පූරු) පෞද්ගලික සමාගම (Somerset Entertainment Ventures (Singapore) Pvt. Ltd.) සමඟ ගිවිසුමකට එළඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුමට එළැඹි දිනය හා ඊට අදාළ කරුණු කවරේද;

(iii) එම ගිවිසුමේ වටිනාකම කොපමණද;

(iv) එකී ගිවිසුම සභාගත කරන්නේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී සමාගම,

(i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම්, ලියාපදිංචි අංකය කවරේද;

(ii) එම සමාගම වෙනත් රටක ලියාපදිංචි සමාගමක් නම්, එම ලියාපදිංචි රට, දිනය හා අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ගිවිසුමට අදාළ දැන්වීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තම වෙබ් අඩවියේ පමණක් ප්‍රචාරණය කරන ලැබුවේද;

(ii) එම දැන්වීම ප්‍රචාරය කළ දිනය කවරේද;

(iii) ඉහත කී සමාගම ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධව මීට ප්‍රථම ගිවිසුම්වලට එළඹී තිබේද;

(iv) එසේ නම්, ඒ අවස්ථාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0601/’10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවට ජී.එස්.පී. ප්ලස් සහනය හිමිවීම නිසා ලැබෙන ප්‍රතිලාභය කවරේද;

(ii) ජී.එස්.පී. ප්ලස් ප්‍රතිලාභය ශ්‍රී ලංකාවට අහිමිවූ දිනය කවරේද;

(iii) මෙම ප්‍රතිලාභය අහිමිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජී.එස්.පී. ප්ලස් සහනය ආරම්භ වූ දා සිට එය අවසන් වූ කාලය තෙක්, වාර්ෂික පදනමින් ඒ යටතේ යුරෝපීය සංගමයට අපනයනය කළ භාණ්ඩ ප්‍රමාණය කවරේද;

(ii) ජී.එස්.පී. ප්ලස් ප්‍රතිලාභ අහිමිවීම හේතුවෙන් අයහපත් ආකාරයේ බලපෑමකට ලක්වූ අපනයනකරුවන්ට රජය උපකාර කළ ආකාරය කවරේද;

(iii) ජී.එස්.පී. ප්ලස් සහනය දැනට භුක්ති විඳින රටවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0838/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවෙන් වෙළඳපොළ පවතින මිලට වඩා වැඩි මිලකට ඖෂධ මිලදී ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දීමට හේතු කවරේද;

(iii) මිලදී ගත් ඖෂධවල වෙළඳපොළ මිල හා සැසඳීමේ දී රජයට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

(iv) පසුගිය කාලයේ දී ඖෂධ හිඟයක් ඇතිවීමට මෙම තත්ත්වය බලපා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිසි අධීක්ෂණයක් නොමැති තත්ත්වයක් තුළ සිදු වූ මෙම අකටයුත්ත සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0896/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාගදීප, මාපාකඩ ජලාශවල ජල මට්ටම අඩුවන විට එම ජලාශයන්හි වැව් තාවුල්ලේ අනවසර වගාකරුවන් විසින් වගාකරන බවත්;

(ii) වසර ගණනාවක සිට වැව් රක්ෂිතයේ සිදුකරන එම අනවසර වගා කටයුතු නිසා රොන්මඩ පිරී එම ජලාශවලට හානි සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම අනවසර වගාකරුවන් විසින් ඉහත සඳහන් ජලාශවලට සිදුකරනු ලබන හානිය නවතාලීම සඳහා ඔවුන්ට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ගයකට යොමු වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0915/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අවසන්වරට ඡන්දයෙන් නිලධාරීන් තෝරාගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම අවස්ථාවේ එහි සභාපති ධූරයට පත්වූයේ කවුරුන්ද;

(iii) වර්ෂ 2005 මාර්තු, 2008 දෙසැම්බර්, 2009 මාර්තු සහ 2010 ජූලි යන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අතුරු කමිටු පත්කිරීමට හේතු වූ කරුණු එක් එක් අවස්ථාවට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අවස්ථාවේ පත් කළ අතුරු කමිටුවල සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව "අතුරු කමිටු" පත්කරනු ලබන අවස්ථා කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2005 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිලධාරීන් තෝරා ගැනීමට තිබූ බාධා කවරේද;

(iii) එම ආයතනයට ප්‍රජාතන්ත්‍රවාදීව නිලධාරීන් තෝරා නොගැනීම ක්‍රිකට් ක්‍රීඩාවේ පැවැත්මට නුසුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ක්‍රීඩා පනතේ 35 වැනි වගන්තිය අනුව ක්‍රීඩා සමාජවල ඡන්දයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නිලධාරීන් තෝරා ගැනීම සඳහා කවර දිනයක කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0578/'10

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන විදේශ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත කී උපාධිධාරීන් වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන විභාග, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන්නේද සහ 2010.01.01 දින සිට එය වෙනත් අධිකාරියකට පවරා තිබේද;

(iv) එසේ පවරා තිබේ නම්, එම නව අධිකාරියේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරක කාලයක් සඳහා මෙරටට අවශ්‍ය වන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරයකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කවරේද;

(iii) ඔවුන්ට ලබාදී ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේදී සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් හට නිවාඩු ලබා විදේශගත වීමට අවසර තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එලෙස නිවාඩු ලබාගෙන විදේශ ගතවීම සඳහා අවසර ලබාදෙන කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0726/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පඹුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරාතලාන උතුර මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදුකළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද ;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, මේ වන විට බොහෝ ස්ථාන ගිලා බැස ඇති බවත්, නියමිත දුර ප්‍රමාණය තාර දමා නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදිකිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0887/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දඹුල්ල නගරයේ හා ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත ප්‍රදේශයේ දෛනිකව එකතු වන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඉනාමළුව වන රක්ෂිතයට බැහැර කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් ඉනාමළුව රක්ෂිතය තුළ විශාල පරිසර හානියක් සිදුවෙමින් පවතින බවත්;

(ii) එසේ බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සමග ඇති පොලිතීන් හා ප්ලාස්ටික් කැබලි ආහාරයට ගැනීම නිසා එම රක්ෂිතයේ වන ජීවීන්ගේ ජීවිතවලට විශාල තර්ජනයක් එල්ලවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉනාමළුව වන රක්ෂිතයට සිදුවෙමින් පවතින පරිසර හානිය වළක්වා ගැනීමටත්, එහි වන ජීවීන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමටත් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0889/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ වර්ෂ 2000 සිට 2008 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අත්පත්කරගත් ඉඩම් ප්‍රමාණය, එම ඉඩම් හිමියන්ගේ නම්, ලිපින හා ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(ii) එම කාලය තුළ ආපසු පවරාගත් පල්ලේවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජී. එම්. පුංචිබණ්ඩා මහතා පදිංචිව සිටි ගොඩනැගිල්ලට, ළිඳකට හෝ ඉඩමට මහා මාර්ග අමාත්‍යාංශයේ ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය මගින් වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, වන්දි ලෙස ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පුංචිබණ්ඩා මහතා විසින් කූට ලේඛන සකසා එම ඉඩමට විදුලිය ලබාගෙන ඇති බවත්, එම ඉඩමට බලපත්‍රයක් ලබා ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතියට අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ආපසු පවරා ගැනීමේදී පුංචිබණ්ඩා මහතාට ගෙවා ඇති වන්දි මුදල් ආපසු ලබා ගැනීමටත්;

(ii) උක්ත ඉඩම වෙනුවෙන් වැරදි සහගත ලෙස බලපත්‍රයක් ලබාදීමට, එහි දේපළට වන්දි මුදල් ගෙවීමට, විදුලිය ලබාදීමට උපදෙස් දුන් හා අනුමත කරන ලද නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0891/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කැප්පෙටිපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වැලිමඩ එළවළු ගොවීන් අසීරු තත්ත්වයට පත්ව ඇති බවත්;

(ii) තම එළවළු සඳහා හොඳ මිලක් නොලැබීම මෙන්ම තම නිෂ්පාදන සඳහා නිසි පරිදි මුදල් නොගෙවීම හේතුවෙන් මෙම ආර්ථික මධ්‍යස්ථානය ගොවීන්ගේ විශ්වාසනීයත්වය ගිලිහී ගිය, ගොවියා සූරාකන ස්ථානයක් බවට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය මග හරවා වෙළෙන්දා හා ගොවියා අතර ගැටලු මතු නොවන, ගොවීන් තුළ ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව විශ්වාසය වර්ධනය කළ හැකි වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීමටත්;

(ii) මෙම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳසැල් පරීක්ෂා කිරීම සඳහා මිල පාලන ඒකකය හා කිරුම් මිනුම් ඒකකයේ සහය ලබා ගෙන ගොවීන් සූරා කෑම අවුරාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටත්;

කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කල්පිටිය අසල ඇති දූපතක් දේශීය හෝ විදේශීය සමාගමකට හෝ පුද්ගලයෙකුට බදු දී තිබේද;

(ii) එසේ නම්, එම දූපත කවර කටයුත්තක් සඳහා, කුමන කාලසීමාවකට, කොපමණ මුදලකට බදු දුන්නේද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූපත බදු දී ඇති සමාගමේ හෝ පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම දූපත බදු දීමට අදාළ බදු ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0602/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂයේදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල විසින් මිලදී ගනු ලැබූ සියලු කොටස් කවරේද;

(ii) ඉහත සඳහන් කොටස්වල ගැනුම් මිල සහ වත්මන් යළි විකුණුම් මිල කවරේද;

(iii) කොටස් මිලදී ගනු ලැබුවේ ලැයිස්තුගත සමාගම්වලින්ද;

(iv) නොඑසේ නම්, ලැයිස්තුගත නොකළ කොටස් මිලදී ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ලැයිස්තුගත කළ සහ ලැයිස්තුගත නොකළ සමාගම් බොහෝමයක සුළුතර කොටස් ප්‍රමාණ මිලදීගැනීම රජයේ ප්‍රතිපත්තියක් ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0839/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රූපවාහිනී සංස්ථාව, 2010 වර්ෂය සඳහා යාවත්කාල සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කර තිබේද;

(iii) 2006 වර්ෂයේ සිට මේ දක්වා මැතිවරණ පැවති කාලසීමාවන් තුළ රජයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ජාතික රූපවාහිනිය වෙන් කළ කාලයන් සහ ඊට අදාළව කළ ගෙවීම් කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා රූපවාහිනී සංස්ථාවට කළ බඳවා ගැනීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවා ගැනීම් සිදු කළ තනතුරුවලට අදාළ සුදුසුකම් සහ බඳවාගත් අයගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0894/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජාතික තරුණසේවා සභාව යටතේ පවතින ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයට අනුබද්ධිත ලියාපදිංචි යෞවන සමාජ සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෞවන සමාජ අතරින් ක්‍රියාකාරී යෞවන සමාජ සංඛ්‍යාව කොපමණද;

(iii) ක්‍රියාකාරී යෞවන සමාජවල මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) එම සාමාජික සංඛ්‍යාව මීට වර්ෂ 5 කට කලින් පැවති සාමාජික සංඛ්‍යාව හා සැසඳීමේදී ප්‍රමාණවත් ලෙස වැඩිවී තිබේද;

(v) නොඑසේ නම් අඩු වී තිබේද;

(iv) ක්‍රියාකාරී යෞවන සමාජයන්හි වත්මන් මුළු සාමාජිකත්වය සෑහීමකට පත්විය හැකි සංඛ්‍යාවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0898/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට වරායට කරදිය පිරවීම සඳහා පැවැති උත්සවය සඳහා වියදම් කරන ලද මුදල් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) එසේ වියදම් කරන ලද මුදල් ලබාගත් අයගේ තොරතුරු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0910/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව මගින් පාලනය වන තේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) තේ වෙන්දේසිවලදී එම තේ වතුවලින් කසළ තේ ලෙස මාසිකව ඉවත් කර ගනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) 2010 අගෝස්තු මාසය තුළ කැලෑ බොක්ක වතුයාය හා ගල්පිහිල්ල වතුයාය මගින් නිපදවූ තේවලින් පරිභෝජනයට නුසුදුසු යැයි පවසා තේ වෙන්දේසිවලදී ඉවත්කොට ඇති තේ කිලෝග්‍රෑම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එමගින් සිදු වූ දළ පාඩුව කොපමණද;

(v) එවැනි පාඩුවක් සිදුවීමට හේතු සොයා බලා එවන් තත්ත්වයක් නැවත ඇති නොවීම සඳහා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0913/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2010 වර්ෂයේදී කිරිබත්ගොඩ විහාරමහාදේවි බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමට පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පාසලට ඇතුළත් කරගත්, පොරොත්තු ලේඛනයේ සිටි හා පොරොත්තු ලේඛනයේ සිට ඇතුළත්කර නොගත් එක් එක් ශිෂ්‍යාවගේ නම, ලිපිනය හා ලබාගත් ලකුණු සංඛ්‍යාව කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විශේෂ නියෝග මත එම පාසලට ඇතුළත් කළ ශිෂ්‍යාවන් පස් දෙනාගේ නම්, ලිපිනයන් ලබාගත් ලකුණු සංඛ්‍යාවන් සහ විශේෂ හේතුව කවරේද;

(ii) 2010 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නියෝග මත අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට සම්පූර්ණයෙන් පටහැනිව විදුහල්පතිනිය විසින් ඇතුළත් කළ, සම්මුඛ පරීක්ෂණයේදී අඩු ලකුණු ලැබූ ශිෂ්‍යාවන් 18 දෙනාගේ නම්, ලිපිනයන් හා ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත පරිදි අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට හා අමාත්‍යතුමාගේ ප්‍රතිපත්තිවලට පටහැනිව ළමුන් පාසලට ඇතුළත් කළ නිලධාරීන්ට හා විදුහල්පතිනියට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත හෝ වෙනත් නීතියක් යටතේ දඬුවම් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0645/'10

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පෞද්ගලික අංශයේ අවම වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) පෞද්ගලික අංශයේ විවිධ සේවක ගණයන් සඳහා වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉකුත් වසර 10 ක කාලසීමාව තුළ පෞද්ගලික අංශ සේවකයන්ගේ වැටුප් වැඩිකරනු ලැබූ අවසන් අවස්ථාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය සේවයේ විවිධ සේවක ගණයන් සඳහා වන අවම විශ්‍රාම වැටුප් සහිත වැටුප් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0840/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකා පිඟන් සංස්ථාවේ වත්මන් සභාපතිවරයාගේ හෝ පත් කළ නිසි බලධාරියාගේ නම සහ සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා පිඟන් සංස්ථාවට අයත් වැඋඩ උළු ගඩොල් කර්මාන්ත ශාලාව පිහිටි ඉඩමේ අයිතිය හිමි අය කවුරුන්ද;

(ii) එම ඉඩම විකිණීමට හෝ බදු දීමට තීරණය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැ උඩ උළු ගඩොල් කර්මාන්ත ශාලාවේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඔවුන් වෙනුවෙන් ලැබිය යුතු ජීවන වියදම් දීමනාව සහ අර්ථ සාධක අරමුදල් 2010 නොවැම්බර් මාසය වන තෙක් ලැබී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම දීමනා ඔවුන්ට ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0895/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලෝක උරුමයක් වූ බෝගොඩ රජ මහා විහාරය සහ ඓතිහාසික බෝගොඩ ලී පාලම ඇති ස්ථානයට යාබදව කළු ගල් වලක් (quarry) පවත්වාගෙන යන බවත්;

(ii) ඒ හේතුවෙන් මෙම පූජා භූමිය ආශ්‍රිතව විශාල පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගල්වල පවත්වාගෙන යෑම සඳහා අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, සංස්කෘතික වටිනාකමකින් යුත් ඉහත ස්ථානයේ සිදුවන පරිසර හානියට වගකිවයුත්තෝ කවුරුන්ද;

(iii) එම පරිසර හානිය වළක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---